**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය සංවර්ධන අරමුදල සමඟ ගිවිසුම්ගත වී තිබුණද ණය කොන්දේසි ඉටු නොකිරීම මත ලබා නොදුන් රු. 8,136,000 ක ණය මුදල වර්ෂයේ ප්‍රාග්ධන ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ප්‍රාග්ධන ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ආදායම රු. 2,529,124 ක් වැඩියෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු. 1,512,008 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයේ අවසානයට ගිවිසුම්ගත වී සමාලෝචිත වර්ෂයේ වැඩ ආරම්භ නොකරන ලද කර්මාන්ත 02 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන රු. 1,500,000 ක් ඇති කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂයේදී මහහීල්ල නැගෙනහිර මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළව බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු මුදල් සඳහා ණයගැති වෙන් කිරීම රු. 520,002 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉතිරි ප්‍රතිපාදන මුදලින් කම්බුස්සාවල මහ ලිඳ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති බැවින් ලැබිය යුතු ණයගැති ශේෂය ගිණුම්ගත කර ඇති බව. | ණයගැති ප්‍රතිපාදන වෙන් කිරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයේ අවසාන තොගය රු. 324,995 ක් අඩුවෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | වර්ෂයේ අවසාන තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී ස්ථිර කාර්යය මණ්ඩල සඳහා වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අඩුවෙන් ලද රු. 95,060 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 පෙබරවාරි මස වැටුප් ප්‍රතිපූර්ණයෙන් නිවැරදි කරගත් බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 209,105,585 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 12,429,192 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු. 247,301,244 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | විස්තරාත්මක තොරතුරු සහිත උපලේඛන පිළියෙල කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ134 (1) වගන්තිය | සභා බල ප්‍රදේශයේ හඳුනාගත හැකි දියුණු කළ ප්‍රදේශ කාලීනව හඳුනාගෙන වරිපනම් බල ප්‍රදේශය සංශෝධනය කරගත හැකි වුවත් සභාව එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හඳුනාගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------------- | | | |
| | i. මුදල් රෙගුලාසි 104 (4) | 2020 නොවැම්බර් 29 දින කැබ් රථයක ඉදිරිපස වීදුරුව මත මොණරෙක් ගැටීම මත සිදුවූ අනතුරට අදාලව පිළියෙල කළයුතු පූර්ණ වාර්තාව 2022 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි. | කොරෝනා වසංගත කාලය තුළ නිලධාරීන් සේවයට කැඳවීම සීමා කර තිබූ නිසා මෙම වාර්තා පිළියෙල කිරීමට නොහැකි වූ අතර ගෙවීම් කිරීම් සඳහා මහා සභාවේ අනුමැතිය ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මුදල් රෙගුලාසි 1645 (ආ), (ඇ) සහ 1646 | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 16 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත කාල පරිච්ඡේදයන් තුළ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විගණනය වෙත ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදය | සභාව සතු වාහන 11 ක ඉන්ධන දහනය පරීක්ෂාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණු අතර ඉන්ධන දහනය පරීක්ෂාව සිදු නොකළ කාල පරාසය වසර 03 ත් 08 ත් අතර විය. | වාහන 02 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර අවසන් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මුළු පුනරාවර්තන වියදම ඉක්මි වූ ආදායම රු. 3,077,515ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම ඉක්මි වූ ආදායම රු. 7,480,572 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,027,000 | 4,288,942 | 3,406,640 | 2,641,115 | 2,772,100 | 2,457,205 | 1,976,290 | 1,752,112 |
| කුලී | 7,139,280 | 5,679,724 | 5,652,114 | 2,019,727 | 11,240,500 | 4,371,907 | 6,694,800 | 4,055,769 |
| බලපත්‍ර ගාස්තු | 285,000 | 178,500 | 178,500 | - | 1,458,200 | 291,040 | 289,990 | 4,450 |
| වෙනත් ආදායම් | 11,358,450 | 14,290,347 | 14,330,077 | 5,467,108 | 975,000 | 522,500 | 838,397 | 784,114 |
| **එකතුව** | **22,809,730** | **24,437,513** | **23,567,331** | **10,127,950** | **16,445,800** | **7,642,652** | **9,799,477** | **6,596,445** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු රු.2,460,825 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්ෂේත්‍රයට ගොස් ජනතාව දැනුවත් කර හිඟ ආදායම් එකතු කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 88 කින් ලැබිය යුතු ව්‍යාපාර හා කර්මාන්ත බදු රු. 148,250 ක් හා අක්කර බදු රු. 31,040 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර හා කර්මාන්ත බදු රු. 45,050 ක් කපා හැරීමටත්, ඉතිරි හිඟය අයකර ගැනීම සඳහා නඩු පැවරීමට සහ අක්කර බදු හිඟ මුදල් ඉදිරියේදී අය කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩකාමර 34 කින් ලැබිය යුතු කඩ කුලී රු. 1,783,497 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනිම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ පළාත් පාලන කොමසාරිස්(දකුණ)ගේ චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර 15 ක් සම්බන්ධයෙන් රු. 3,837,500 ක එක්වන් මුදල් අයකරගෙන නොතිබුණි. | 2023 ජනවාරි 17 දින වර්තමාන බදුකරුවන්ට එක්වන් මුදල් ගෙවන ලෙස දැනුවත් කර ඇති අතර ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 236,230 ක වෙළඳ අයිතිය බදු දීමේ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | සභාව බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණයේ බදුකරුවන් සමඟ අත්සන් කළ ගිවිසුම අනුව අතුරු බදුදීම සිදුකළ නොහැකි වුවත්, 2022 නොවැම්බර් 25 දින සිදුකළ ස්ථානීය පරික්ෂාවේදී සභාව සතු කඩකාමර 08 ක් අතුරු බදුදී තිබුණි. | මෙම කඩකාමර 08 පිළිබඳව නැවත සමීක්ෂණයක් සිදු කළ අතර, එහිදි කඩ බදුකරුවන් විසින් අතුරු බදු නොදී පවත්වාගෙන යන බවට වාර්තා කළ බව. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු යන්ත්‍ර උපකරණ කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 1,239,239 ක කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 1,096,289 වසර ගණනාවක සිට පැවත එන හිඟ මුදලක් වන අතර ඊට අදාල විස්තරයන් සොයා ගැනීමට නොහැකි බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 03 කින් ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 155,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (එ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී බදුදුන් කඩ කාමර 03 න් ලැබිය යුතු රු. 503,000 ක එක්වන් මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදි කටයුතු කර නොතිබුණි. | බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණයේ අංක 02 හා 03 කඩ කාමර වලට අදාල එක්වන් මුදල් අයකිරීමට සහ 2022 වර්ෂයේදී බදු දුන් කඩ කාමරයකින් ලැබිය යුතු රු. 65,000 ගෙවන මෙන් දැනුවත් කළ බව. | හිඟ එක්වන් මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඒ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 3,824,705 ක් විය. | හිඟ මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහහීල්ල ප්‍රජා ශාලා මධ්‍යස්ථානයෙහි ජල ගබඩා ටැංකිය ඉදිකිරීමේ කර්මාන්තය යටතේ ජල ගබඩා ටැංකියේ ජල කාන්දුව වැලැක්වීම සඳහා රු. 71,032 ක් ගෙවීම් කළද එම කාර්යය ඉටුකර නොතිබුණි. | මෙම කාර්යය නැවත ඉටු කිරීම සඳහා සමිතිය වෙත උපදෙස් ලබා දුන් අතර එය ඉටු කළ පසු රැඳවුම් නිදහස් කිරීමට කටයුතු කරන බව. | එම කාර්යය ඉටු කර ව්‍යාපෘතිය සාර්ථක කර ගත යුතුය. |
| (ආ) | බෙලිඅත්ත මහහීල්ල කටුඉඹුල්ගහදෙනිය පොදු ළිඳ සකස් කිරීමේ කර්මාන්තය යටතේ ළිඳෙහි ඉහල කොටස සඳහා කොන්ක්‍රීට් ආවරණය යෙදීම වෙනුවෙන් වර්ග මීටර් 12.2 ක් සඳහා රු. 73,631 ක් ගෙවීම් කර තිබුණද ඉදිකර තිබූ ප්‍රමාණය වර්ග මීටර් 8.2 ක් විය. මෙම ළිඳ ඉදිකර වසර දෙකකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද ළිඳ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා තිබීම නිසා වැයකරන ලද රු. 775,000 නිශ්ඵල වියදමක් වී තිබුණි. | ප්‍රතිපාදන මුදල් ලැබුණු පසු ඉතිරි කාර්යයන් සම්පූර්ණ කර ළිඳ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | අපේක්ෂිත අරමුණු ඉටු කරගත හැකි වන පරිදි වියදම් දැරිය යුතුය. |

### 3.2 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පෞද්ගලික ආයතනයක් විසින් සභා පරිශ්‍රය පිරිසිදු කිරීමේ සේවාව සපයනු ලබන අතර, 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය | අතිරික්ත සෞඛ්‍ය කම්කරුවන් නිරතුරුවම නිවාඩු ලබා ගන්නා නිසා | සභාවේ සේවකයන් සභාවේ කාර්යයන් |

| | | |
|---|---|---|
| දක්වා දරන ලද එකතු වියදම රු. 2,667,365 ක් විය. සභාවේ වත්මන් කාර්යය මණ්ඩලය තුල වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් සහ සෞඛ්‍ය කම්කරුවන්ගේ අතිරික්තය පිළිවෙලින් 8 ක් හා 12 ක් වු අතර එම අතිරික්ත කම්කරුවන් යොදාගෙන සභා පරිශ්‍රය පිරිසිදු කිරීමේ කාර්යය ඉටුකරගත හැකිව තිබියදී බාහිර ආයතනයකින් එම සේවාව සපයා ගැනීම මත දරන ලද මුළු වියදමම අනාර්ථික වී තිබුණි. | කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා සේවකයන් යෙදවිය නොහැකි බව. | සඳහා යෙදවීම කළමනාකරණය කරගත යුතුය. |

**3.3 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් බෙලිඅත්ත ධීවර ගොඩනැගිල්ල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික කුලිය රු. 9,000 ක් ලෙස තක්සේරු කර තිබියදී මාසික කුලිය ලෙස රු. 5,000 ක් 2021 ජනවාරි සිට අයකිරීමට සභාව තීරණය කර තිබීමෙන් තක්සේරු කුලිය අයනොකිරීම මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභා අරමුදලට සිදුවී තිබු පාඩුව රු. 96,000 ක් විය. | 2023 වර්ෂයේ ජනවාරි මස සිට නව තක්සේරු මුදල අයකරන බව. | තක්සේරු කුලිය අයවිය යුතුය. |

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පෙර වර්ෂයන් වලදී නඩු පවරන ලද පුද්ගලයන් තිදෙනෙකුගෙන් ලැබිය යුතු රු. 519,632 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අධිකරණයෙන් තොරතුරු ඉල්ලා ඇති අතර ලද පසු ඉදිරිපත් කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ධාවනයෙන් ඉවත් කළ විවෘත භූමියේ ගාල්කර තිබු වාහන 03 ක් අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ධාවනයෙන් ඉවත් කළ වාහන වලින් කැබ් රථයක් අලුත්වැඩියා කළ අතර ඉතිරි වාහන 02 අපහරණය කිරීමට තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව. | වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු වාහන 09 ක, ඉඩම් හා ගොඩනැගිලි 10 ක, ප්‍රජා ශාලා 07 ක හා සුසාන භූමි 03 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගත වු ට්‍රැක්ටර් රථය හැර ඉතිරි වාහන 08ක අයිතිය සහ ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරා දෙන මෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කළ බව. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සභාවේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් නිෂ්පාදන වැඩපලෙහි හා කොහුමෝල කර්මාන්තයට අයත් මෝටර් 02 ක්, ලීටර් 1000 වතුර ටැංකියක් සහ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් නිෂ්පාදිත යන්ත්‍රය වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි. | මෝටර් දෙක වෙන්දේසි කළද ඒ සඳහා කිසිවකු ඉදිරිපත් නොවූ අතර ඉතිරි යන්ත්‍රය සභාවේ අවශ්‍යතා සඳහා තබාගෙන ඇති බව. | වත්කම් ඵලදායිව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 වගන්තියට අනුකූල නොවන ලෙස එකතු වටිනාකම රු. 1,792,185 ක් වූ භාණ්ඩ වර්ග 05 ක් මිලදීගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බෙලිඅත්ත කොටියා ගොඩැල්ල මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර රු. 3,424,834 ක් ගෙවා තිබුණි. | | |
| i. | ක්‍රීඩා පිටියේ පස් කපා ගොනුකර පැටවීම වෙනුවෙන් රු.158,776 ක් සහ පැතිබැම්ම ඉදිකිරීම සඳහා පාදම සකස් කිරීමට අත්තිවාරම කැපීම වෙනුවෙන් රු.41,174 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පස් ගොනු 03 මිනුම් නොගත් නිසා මිනුම් පත්‍රයට ඇතුළත් නොකළ බව සහ ගෙවීම් වාර්තාවේ සඳහන් පස් ප්‍රමාණයට වඩා 50 $m^3$ ක් ඉවත් කළ නිසා වැඩිපුර ගෙවීමක් සිදුකර නොමැති බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| ii. | පැති බැම්ම සුමට නිමාවක් සහිතව ඉදිකිරීමට හැඩයම් වැඩ යොදාගැනීම වෙනුවෙන් රු. 285,048 ක් ගෙවීම් කර තිබුණද ඉදිකර තිබූ පැති බැම්ම රළු නිමාවක් සහිතව නිමකර තිබුණි. | පැති බැම්මේ ඉදිරිපස පෙනුම මෘදු ලෙස නිම කර ඇති අතර එහි ප්‍රසාරණ මූට්ටු පමණක් මෘදු නොවන ලෙස ඇති බව. | ඇස්තමේන්තුවේ සඳහන් ආකාරයට නිමකර ඇති කාර්යයන් සඳහා පමණක් මුළු මුදලම ගෙවිය යුතුය. |
| (ආ) | කහවත්ත ජිනදාස මාවත සංවර්ධනය කිරීම - II අදියර කර්මාන්තය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.1,947,934 ක් ගෙවීම් කිරීමේදී, | | |
| i. | මාර්ගය සඳහා මිලිමීටර් 37.5 ප්‍රමාණයේ ගල් (ABC) සපයා තලා සනවත් කිරීමේ කාර්යය සඳහා වැරදි මිලගණන් යොදාගැනීම මත රු. 156,860 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මාර්ග තලයේ එකවර ABC නොයොදා කොටස් වශයෙන් ABC යෙදූ බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | මාර්ගය සඳහා යෙදීමට අවශ්‍ය කාපට් ප්‍රමාණයට වඩා වැඩියෙන් යෙදූ බව දක්වමින් රු. 264,316 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මාර්ගයේ දිග මීටර් 09 ක් වැඩිපුර ඉටු කළ අතර මිලි මීටර් 50 ට වඩා වැඩි ඝනකමකින් කාපට් ඇතිරීම සිදුකළ බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතුය. |
| iii. | මාර්ගය සඳහා යොදාතිබූ මිලිමීටර් 37.5 ප්‍රමාණයේ (ABC) ගල් සම්පිණ්ඩනය විය යුතු ප්‍රමාණය සියය හෝ ඊට වැඩි විය යුතු වුවත්, තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව සම්පින්ඩනය වී ඇති ප්‍රමාණය සියයට 98 ක් වුවද ගල් සැපයීම හා ප්‍රවාහනය වෙනුවෙන් රු. 220,325 ක් ගෙවීම් කර තිබුණි. | ගල් සම්පිණ්ඩනය වී ඇති ප්‍රතිශතය සියයට 98 ක් හා පලුදුවීම් සිදුවී නොමැති බව. | නියමිත ප්‍රතිශතයට ගල් සම්පිණ්ඩනය වී තිබිය යුතුය. |
| (ඇ) | කහවත්ත සව්සිරිපුර ප්‍රජා ශාලාවේ දැල් ආවරණ යොදා නවීකරණය කිරීමේ කර්මාන්තය යටතේ ප්‍රජා ශාලා ගොඩනැගිල්ලෙහි දැල් ආවරණ සහ යකඩ දොරවල් සකස් කිරීම වෙනුවෙන් රු. 429,807 ක් ගෙවීම් කර තිබුණද දැල් ආවරණ වල සහ දොරවල් වල මල නොබැඳෙන තීන්ත හා එනමල් තීන්ත නිසි පරිදි ආලේප කර නොතිබීම නිසා එම දැල් ආවරණ සහ දොරවල් මල බැඳීමට ලක්ව තිබුණි. | අඩුපාඩු නිවැරදි කරන ලෙස කොන්ත්‍රාත් සමිතිය දැනුවත් කළ බව. | ගෙවීම් කිරීමට පෙර ඇස්තමේන්තු ප්‍රකාරව වැඩ නිම කර තිබිය යුතුය. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලයෙහි තනතුරු 13 කට අදාළ සේවක අතිරික්තතා 66 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි | දෛනික වැටුප් ලබන සේවකයින් 45 ක් හා 25/2014 චක්‍රලේඛය මඟින් බඳවාගත් සේවකයන් තත්‍ය සේවක සංඛ්‍යාවේ සිටීම හේතු වූ බව. | අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |